# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1588/18 - 2009 පෙබරවාරි 11 වැනි බදාදා - 2009.02.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක : 29.

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින් සෑම පොලිතීන් ආහාර එතුම්/ දවටන සහ අපද්‍රව්‍ය බහාලුම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දෙකු විසින්ම සෑම පොලිතීන් ආහාර එතුම් /දවටන සහ අපද්‍රව්‍ය බහාලුම් අඩංගු පැකට්ටුවකම හෝ බණ්ඩලයකම පහත සඳහන් කරුණු ඇතුළත් ලේබලයක් තිබිය යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

01. නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය ;
02. නිෂ්පාදිත දිනය ;
03. භාණ්ඩයේ අනුරූප සූචක නාමය ( Generic Name ) ;
04. සාමාන්‍ය ඝනකම මයික්‍රොන් වලින් ( µ ) ;
05. නිෂ්පාදකයාගේ පරිසර ආරක්ෂණ බලපත්‍ර අංකය ( EPL Number ) ;
06. නිෂ්පාදකයාගේ ව්‍යාපාර/සමාගම් ලියාපදිංචි අංකය
07. පොලිතීන් ආහාර එතුමේ / දවටනයේ හෝ අපද්‍රව්‍ය බහාලුමේ මිනුම් ( Dimensions ) මිලි මීටර් (mm) වලින්.

මෙම විධානයේ කාර්යය සඳහා "පොලිතීන්" යන්නෙන් සෑම ස්වරූපයකම පොලිඑතිලින්, පොලිප්‍රොපිලින්, පොලිස්ටයිරින්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිඑතිලින් ටෙරිතැලේට් හෝ වෙනත් යම් සමාන අමුද්‍රව්‍ය අදහස් වේ.

මෙම විධානය වර්ෂ 2009 අගෝස්තු මස 15 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2009 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.
02-606


1A - G 010771— 580 (2009/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.